# POLITICAL IDEOLOGIES
# (Part III)

# සමූහාණ්ඩුවාදය

මෙය ලිබරල් වාදය මෙන් ම දේශපාලන මතවාදයක් වන අතර ම දේශපාලන න්‍යාය සහ දේශපාලන දර්ශනය යන වර්ගීකරණයට ද අයත් වේ.

දේශපාලන ප්‍රජාව, පුරවැසි භාවය, නිදහස සහ දේශපාලනය පිළිබඳ සමූහාණ්ඩුවාදී අදහස් නූතන රාජ්‍ය, එහි ස්වභාවය හා අරමුණු නිර්ණය කිරීමට වැදගත් දායකත්වයක් සපයා තිබේ.

ලිබරල් වාදය සහ සමූහාණ්ඩුවාදය එකිනෙකට වෙනස් දේශපාලන මතවාද නොවූවත්, ඒ දෙක අතර පවතින වෙනස්කම් හඳුනාගැනීම, එම මතවාද නිශ්චිත ව හඳුනාගැනීමට ආධාර වනු ඇත.

සමූහාණ්ඩුවාදය, දේශපාලන සංකල්පයක් ලෙසත්, දෘෂ්ටිවාදයක් ලෙසත් දිගු ඉතිහාසයකට හිමිකම් කියයි. එම ඉතිහාසය ග්‍රීක, රෝම යුගයන් දක්වා දිවයයි.

ClassWork.LK

සමූහාණ්ඩුවාදී අදහස්වල වර්ධනය අවධි 4 ක් යටතේ පෙන්වා දිය හැකි ය.

I. සම්භාව්‍ය සමූහාණ්ඩුවාදය :- ග්‍රීක හා රෝම සමූහාණ්ඩුවාදී යුගය - ඇරිස්ටෝටල් ,පොලිබියස් සහ සිසරෝ.

II. යුරෝපයේ පුනරුද සමය :- මැකියාවෙල්ලි වර්ධනය කළ සමූහාණ්ඩුවාදී චින්තනය.

III. දහඅට වැනි සියවසේ ප්‍රංශ සහ ඇමරිකානු සමූහාණ්ඩු වාදය - ප්‍රංශයේ රූසෝ," මොන්ටෙස්කියු සහ ඇමෙරිකාවේ තෝමස් ජෙෆර්සන් සහ ජේම්ස් මැඩිසන්.

IV. විසි වැනි සියවසේ සමූහාණ්ඩුවාදය :- හැනා ඇරෙන්ඩ්ට්, ක්වේන්ටින් ස්කිනර්, ෆිලිප් පෙටිට් (Hannah Arendt, Quentin Skinner and Philip Pettit) විසි වැනි සියවසේ සමූහාණ්ඩුවාදයේ ප්‍රධාන ප්‍රකාශකයෝ ය.

ClassWork.LK

සමූහාණ්ඩුවාදයේ පොදු හරාත්මක මූලධර්ම කීපයක් ම තිබේ.

I. සමූහාණ්ඩුවාදය රාජාණ්ඩුවාදයට එකහෙළා විරුද්ධ ය. මෙය 18 හා 19 වැනි සියවස්වල ලිබරල්වාදයට සමාන්තර ව වර්ධනය වූවකි.

II. සමූහාණ්ඩුවාදයට අනුව පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා රජු/පාලකයා නොව මහජනතාවයි. මෙය ද සම්භාව්‍ය ලිබරල්වාදයට සමාන්තර ව බිහි වූ රාජාණ්ඩු විරෝධී ස්ථාවරයකි.

III. රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් පත් කරගත යුතු බව අවධාරණය කරන අතර, එකී අදහස 18 සියවසෙන් පසු වර්ධනය වූ මූලධර්මයකි.

ClassWork.LK

IV. පුරවැසියා දේශපාලන වශයෙන් සක්‍රීය, විපරම්කාරී, දේශපාලන සත්ත්වයෙකු ලෙස ක්‍රියාවලියට සහභාගි වන්නේ ය. දේශපාලනික වශයෙන් සක්‍රියව සිට පොදු යහපත වෙනුවෙන් කැප වී වැඩ කිරීම සමූහාණ්ඩුවාදී පුරවැසි භාවයේ ප්‍රධාන ලක්ෂණයයි. මෙය ඇරිස්ටෝටල් ගෙන් පටන් පැවත එන අදහසකි. මෙම ගති ලක්ෂණ ඔවුන් හඳුන්වන්නේ ''පුරවැසි යහගුණය'' (Civic virtue) යනුවෙනි

V. පුරවැසියන් දේශපාලන ප්‍රජාවක් (Political Community) ලෙස සංවිධානගත ව සිටී මේ අරමුණ වන්නේ සෑම පුරවැසියකුට ම පොදු යහපත (Common Good) සැලැස්වීම යි.

ClassWork.LK

VI. දේශපාලනයේ අරමුණ නිදහස යි. එය පුරවැසියන්ට සක්‍රිය ව මිසක නිෂ්ක්‍රිය ව සිටීමෙන් ලබා ගැනීමට හෝ රැක ගැනීමට හෝ හැකි දෙයක් නොවේ. පහසුවෙන් නැති විය හැකි සම්පතක් වන නිදහස රැකගත හැක්කේ පුරවැසි දේශපාලන සහභාගිත්වය යන ක්‍රියාකාරීත්වය මඟිනි. මෙය ''පුරවැසි සක්‍රියත්වය'' (Civic engagement) යන න්‍යායික පදයෙන් හැඳින්වේ.

ලිබරල්වාදය හා සමූහාණ්ඩුවාදය එකිනෙකින් වෙනස් වන්නේ මෙම ලක්ෂණවලිනි.

ClassWork.LK

# පුරවැසියා සහ දේශපාලනය.

සමූහාණ්ඩුවාදයට අනුව පුරවැසි භාවය යනු හුදෙක් රාජ්‍යයේ/දේශපාලන ප්‍රජාවේ සාමාජිකත්වය ලබා ගැනීම ම නොවේ. දේශපාලන ක්‍රියාවලියට සක්‍රිය ලෙස සහභාගී වන, ඒ මඟින් පොදු යහපත වෙනුවෙන් කැප වී වැඩ කරන පුරවැසියන් සතු යහගුණයකි.

''දේශපාලනයේ යෙදීම'' යනු එම පොදු යහපතත්, නිදහස සාක්ෂාත් කර ගැනීමත් අරමුණු කරගෙන අන්‍ය පුරවැසියන් ද සමඟ හවුලේ හෙවත් සාමූහිකව කටයුතු කිරීම යි. පුරවැසියා සක්‍රිය ව දේශපාලනය කළ යුතු අතර නිදහස රැකෙන්නේ එවැනි ක්‍රියාකාරිත්වයකිනි.

එහෙත්, මේ පිළිබඳ ලිබරල් අදහස මීට වෙනස් ය. පුරවැසි භාවය යනු රාජ්‍යයේ/දේශපාලන ප්‍රජාවේ සාමාජිකත්වය හිමි වීම යි. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුරවැසියා කරන්නේ තමන්ට ලැබී තිබෙන නිදහස පෞද්ගලික ව, නිහඬ ව භුක්ති විඳීම යි.

සක්‍රිය ව දේශපාලන අරගලයේ යෙදීමට පුරවැසියාට සිදුවන්නේ ලිබරල් නොවන සහ ප්‍රජාතන්ත්‍රවාදී නොවන දේශපාලන ක්‍රමයක් තුළ ය.

ClassWork.LK

## නිදහස

ලිබරල්වාදය ''නිදහස'' සංකල්පගත කළේ ''පෞද්ගලික නිදහස (Personal Freedom)'' වෙනුවෙනි. එනම් රාජ්‍යයෙත්, සමාජයේත්, අන්‍යයන්ගේත් බාධා කිරීම් සහ මැදිහත් වීම් ආදියෙන් විනිර්මුක්ත ව තනි පුද්ගලයන්ට තම සිතැඟි පරිදි, අන්‍යයන්ට බාධාවක් නොවන පරිදි සිතීමේ, ක්‍රියා කිරීමේ හා ජීවත් වීමේ නිදහස යි. ඉහත සඳහන් කර ඇති පරිදි මෙය හැඳින්වෙන්නේ ''නිෂේධනීය නිදහස'' (Negative-Freedom) යනුවෙනි. එනම් බාධාවලින් තොර ව ලැබෙන නිදහස (Freedom from constraint) යන්න යි.

සමූහාණ්ඩුවාදයට අනුව නිදහස යනු පුරවැසියන් තම අරගල මඟින් සාක්ෂාත් කර ගන්නා සහ ආරක්ෂා කරගන්නා අයිතියකි. නිදහස යනු නිසර්ගයෙන් ම අහෝසි වීමේ තර්ජනයට මුහුණ පාන පොදු අයිතියකි. එය රැකගැනීම සඳහා ලිබරල්වාදය යෝජනා කරන නෛතික, දේශපාලන රාමුව ප්‍රමාණවත් නොවන අතර, ඒ සඳහා පුරවැසි ක්‍රියාකාරිත්වය (Civic engagement) අත්‍යවශ්‍ය බව මෙ මඟින් කියැවේ.

ClassWork.LK

# අද්‍යතන සමූහාණ්ඩුවාදී චින්තනය.

20 සියවසේ සමූහාණ්ඩුවාදී සම්ප්‍රදායයේ ප්‍රධාන චින්තකයන් වූ හැනා අරෙන්ඩට්, ක්වෙනටින් ස්කිනර් සහ පිලික් පෙටිට් යන තිදෙනා මතු කළ අදහස්වල ප්‍රධාන තේමා දෙකකි.

i. දේශපාලන ආධිපත්‍යවාදයෙන් තොර ව සාක්ෂාත් කෙරෙන නිදහස (Freedom from domination)

ii. නිදහස සාක්ෂාත් කර ගැනීමේ මාධ්‍යය වශයෙන් පුරවැසි ක්‍රියාකාරිත්වය.

ClassWork.LK

20 සියවසේ සමූහාණ්ඩුවාදය පුරවැසියාගේ දේශපාලන ක්‍රියාකාරිත්වයට සහ කාර්යභාරයට විශේෂ අවධානයක් යොමු කරන නිසා එය ''පුරවැසි සමූහාණ්ඩුවාදය'' (Civic Republicanism) යනුවෙන් ද හැඳින්වේ.

ClassWork.LK

ClassWork.LK